සුබස් සිතිවිල

අලුත් අලුවුලි

සුගිය අවුරුද්දේ ඔක්තෝබර් සන්නසේ පළවූ ගනේවත්ත (ගේ) පාලිතයන්ගේත් එදිරිසිංහ (ගේ) ජගතුන් ගේත් ලිපි දෙක කියවූ මට ඔවුන් ඒ ලිපි දෙකෙන් කරන කතා-බහට හොට ලෑමට සිත්විය. (දෑස් දෙකේ) පෙනීමේ දෝසයක් හේතුවෙන් මාස දහයක් පමණ ලියුම් කියුම් වලින් වැලකී සිටි නිසා මේ ලිපිය ලිවීම ද පමා විය.

මා ඔවුන් දෙදෙනාගේ නම් ලිවීමේදී ඔවුන් දෙදෙනා තම නම භාවිතා කරන විදිය වෙනස් කොට ලියා ඇති බව පළමුවෙන් ම කියමි. එයට හේතුව දැක්වීම වෙන ම ලිපියකින් කල යුතු වුවත් මෙහි කෙටියෙන් එය කරමි.

පෙලපත් නම හෙවත් 'ගේ' නම වරනඟා ලිවීම වැරදි බවත් - ලිවිය නොහැකි බවත්, අමාරුවෙන් එය කලත් කියවීමේ දී එහි ඇති අමුත්ත තේරුම් යන බවත් මම දනිමි.

වැලිගමගේ අමරසේන නැමැත්තා, වැලිගමගේ අමරසේනයෝ - අමරසේනයන් යනුනේ තම නම ලියයි. 'අමරසේනයා' යනුවෙන් ලිවීම ද නිවැරදිය. රනසිංහගේ සුමනදාස නැමැත්තා, රනසිංහගේ සුමනදාසයෝ - සුමන-දාසයන් යනුවෙන් තම නම ලියයි. -සුමනදාසයා යනුවෙන් ලිවීම ද නිවැරදිය. අමරසේනයා සහ සුමනදාසයා යනු නොගරුව (නිගරුව නොවේ) සඳහා භාවිතා වේ.

මහවිස + ඕ - මහවිසදයෝ ,
කේවට්ට + ආ - කේවට්ටයා

යන නම් දෙක විමසීමෙන් එය තේරුම් ගත හැකිය. ගමේ ගොඩේ සිටින ජේමිසා , මාටියා ගැන ද හිතන්න. ජේම්ස් අයියා / ගොය්යා , මාටිං අයියා / ගොය්යා යනුවෙන් යෙදූ විට එහි හැඟ්ලුව ඉවත් වේ. 'මහත්තයා ' බර වැඩි නිසා එය බැහැර කරඇතැයි සිතමි.

වැලිගමගේ අමරසේන නැමැත්තා දැන් ඉංග්‍රීසි විදියට අමරසේන වැලිගමගේ යනුවෙන් රනසිංහගේ සුමනදාස නැමැතා දැන් ඉංගිරිසි විදියට සුමනදාස රනසිංහ යනුවෙනුත් තම නම් ලියති. වැලිගමගේ තම 'ගේ' රැක ගන්නා අතර රනසිංහගේනම 'ගේ' කඩා දමා බැහැර කර ඇත.

දැන් අමරසේනයන්ටත් සුමනදාසයන්නටි ගැටයක් ඇතිවේ අමරසේන වැලිමගේ යෝ / වැලිගමයේ යන්, සුමනදාස රනසිංහයෝ / රනසිංහයන් යනුවෙන් තම නම වරනඟා ලිවීමට සිදුවීම ඒ ගැටයයි. රනසිංහයන්ට මෙතැන දී ඒ ගැටය මතු නුනේ 'සිංහ' ප්‍රාණවාචි නාම පදයක් නිසාය . අප්‍රානවාචි 'ගේ' ට ඒ වාසිය නැත.

ඔහෙත් ඔවුන්ගේ දුන් දෙදෙනාට ඒ ගැටය ලිහා ගත නොහැක. අමරා වැලිගමගේ - අමරා වැලිගමගේයාවෝ / වැලිගමගෙයාවන් යන වරහත්, තමරා රනසිංහ - තමරා රනසිංහවෝ / රනසිංහාවන් යන වහරත් සිංහල නොවේ. එසේම අමරාවෝ / අමරාවන් වැලිගමගේ යන වහරත් තමරාවෝ / තමරාවන් රනසිංහ යන වහරත් සිංහල නොවේ.

උපේ පෙලපත් නම් 'ගේ' මුල් කරගෙන හැදි ඇති නිසා අප්‍රානවාචි 'ගෙ' ශබ්දය ප්‍රාණවාචි විභක්ති යොදූ වරනැඟීම නොකල හැකිය.

'බෙරහු ද්වනි මුහුම්භ ගසෙක් සුලඟට වැනේ' යන වියරන නියරට අනුව 'අමරසේන වැලිගගෙනු' අමරසේන වැලිගමගේයෙක් / වැලිගමගෙයා යනුවෙන් ලිවීම ද අමුතුය. එය සිංහල වහරට පටහැනිය. මා කිසිවකුගේ පෙලපත් නමක් වරනඟා නොලියන්නේ ඒ නිසාය මුනිදස කුමාරතුංගයෝ , අරිසෙන් අනුබුදුවෝ, ජයන්ත වීරසේකරයෝ මගේ පෑනට නුරා නැත. මගේ පෑන පුරුදු වී ඇත්තේ කුමාරතුංග (ගේ) මුනිදසයෝ, අනුබුදු (ගේ) අරිසෙන්නු , වීරසේකර (ගේ) ජයන්තයෝ යන විදියටය. ජයසේකර අබේසේ-කර (අබේරුවන්) නිවැරදිය.

යලිත් (පැරනි) නිවැරදි වහරට ඇද ගත නොහැකි විදියට අද බොහෝ දෙනා තම නම ලියන බව ඉංගිරිසි ක්‍රමයට ලියන බව රහසක් නොවේ. පෙලපත් නමේ හෝ තැනැති නමේ මුලකුර ලිවීමේ දී අප භාවිතා කරන්නේ ඉංගිරිසි හෝඩියේ අකුරකි.

වැ. අමරසේන-ඩබ්ලිව්(ඩී) අමරසේන ර.සුමනදාස - ආර් සුමනදාස යන නම් දෙකත්,

ආ. විලිගමගේ - ඒ. වැලිගමගේ , සු. රනසිංහ එස්. රනසිංහ යන නම් දෙකත් සිහිමත් ව විමසූ විට එය තේරුම් ගත හැකිය.

ඕපාතගේ ජයරත්න සිංහල විදියට ඕ. ජයරත්නය
ඉංගිරිසි විදියටත් (O. Jayaratna) ඕ. ජයරත්නය

ඊරියගමගේ සමන්ත සිංහල විදියට ඊ සමන්තය ත
ඉංගිරිසි විදියටත් (E. Samantha) ඊ සමන්තය .

එහෙත් ඒකනායකගේ නිලන්ත සිංහල විදියට ඒ. නිලන්තය
ඉංගිරිසි විදියට (E. Nilantha) ඊ. නිලන්තය ත

උඩගමගේ ජයසේන සිංහල විදියට උ. ජයසෙ-'නය
ඉංගිසිරි විදියට යු. ජයසේන ය.

මෙහිදී ඉතා වැදගත් වන්නේ ,
ජයරත්නගේ දුව 'ජයරත්නාවියෝ / යන් , හෝ සේනානායක දුව ' සේනානායකාවෝ / වන් නොවීමය.

අපට දැන් අපේකම, අපේ ගතිය, අපේ විදිය ඇදය. (එල්ලවලගේ) ඒ. ජයන්ත, (උඩගමගේ) උ. නිලන්ත (කොග්ගල වෙල්ලාගේ) කො. වෙ. සාලිනී වැනි නම් ඇදට පෙනෙන්නේ ඒ නිසාය.

ඩී.බී. කුරුප්පු (වියතුන්) සුරීන් ගේ හැඟැති නම නොදන්නා මම කිසි විටක කුරුප්පුනු / කුරුප්පු-න් ' යනුවෙන් ඔවුන් නො හඳුන්වමි. තැනැති නම වෙනුවට ගෙ-නම භාවිතා කරන්නන් ගැන ලියන විට මම ඒ ගෙ-නම අගට සුර, මහත් , (උතුම්) තුම්, මෙහාවි වැනි නාම පදයක් වරනඟා ලියමි. ඒ.වී සුරවීර සුරීන්, ඩඩ්ලි සේනානායක් මහතා, මා. ගේ. ලියනගේ තුමා ආදී වශයෙනි.

මහවිසඳ පණ්ඩිතයෝ , දුටුගැමුණු රජ්ජුරුවේ, සිදුහත් කුමරා, පන්ඩුල බමුනා, අනුලා බිසව, අමරා දේවී යනු සිංහල වියහයේ පන්ඩිත මහවිසඳ, රජ්ජුරු දුටුගැමුණු, කුම සිදුහත්, බමුනු පන්ඩුල, බිසම් අනුලා, දේවි අමරා /විහාර මහා යනු සිංහල වහරක් නොවේ.

එහෙත් අද පුජ්‍ය නාරද, මහාචාර්ය සේනක, පන්ඩිත ගුනසේන යන වියහරක් දක්නට ලැබේ. එය ඉරල එරල ණසබටලුමැබල ජරසබජැල සෑඩග යන ඉංග්‍රිසි විදිය අනුයෑමක්යැ සිතේ.

මම මා පිය කරන 'ජගතා' වෙනුවට මෙහි ජගත්තු / ජයතුත් ලියමි.

කෙසේ වෙතත් පාලිතයන්ගේ ලිපිටයත් ජගතුන්ගේ ලිපියටත් හොට ලෑම ගැන ඔවුන් (දෙදෙනා) නොසතුටු නොවෙතියි සිතමි.

පාලිතයන්ගේ ලිපියෙහි දක්නට ලැබෙන ඇතුලත්, මැලි, ගිලිහී නොදී, විනිශ්චය යන වචනත්, ජගතුන්ගේ ලිපියේ දක්නට දැබෙන පුලුවන්ද, නොසළකා, නිෂ්ශබ්දතාවය, කලින් විසුල, පිලිබඳ වැනි (සම්මතයට පටහැනි) වචනත් යතුරු දෙස් විය යුතු යයි සිතමි. ඔවුන් දෙදෙනාම ඉතාමත් සරල භාෂාවෙන් කියා ඇති දේ තේරුම් ගැනීම පහසුය. එසේම ඒ ඉතා කාලෝචිත ලිපි දෙකක් බව කිය යුතුය.

ජයතුන්ගේ ලිපියෙහි එන 'කෙනෙක් වෙත් නම්' සහ 'පිලිනොගන්නා' යන දෙතන යතුරු දෙස් නොවෙතැයි සිතමි.

ගුත්තිල කාව්‍යයේ'එන 'අද මව්පිය දෙදෙන - ඔහු වයස බව නොම දැන - කතී වෙන මීයන - සුසු යස් අත ගැසු සැකයෙන 'යන ගීයේ ' මීයන් වෙන කති ' ය් (මීයන වෙන කතී) යනුවෙන් වැරදීමකින් හෝ විරිත රැකීම සඳහා නොවේ. 'මීයන' යනු එලිවැට රැකීම සඳහා කල විකාරයකි.

"රසැති කෑම ලොව බොහේ තිබෙත් - හිගන්නන්ට කොයින්ද
උනු බත්' (සින්දුවක කොටසක්)
යන තැන ' .... කෑම .... තිබෙත් ' යනුවෙන් එලිවැට රැසකට සඳහා කල ' මහා සාවද්‍ය දෝශය'
වැනි දෝසයක් මෙහි සිදු වී නැත.

"ඇදුර තුටු නොවෙතිස් - නොසිතප සිප් නොදිතියි
උනුමු වෙන සඳතිස් - නොදත්තටු ගායනා කෙරෙතියි -

ඇදුර (අප) තුටු නොවෙතිස් (නොසීමා) , (ඇදුර) අප සිප් නොදැනිතියි නොසිත, (ඇදුර, තොප) වෙන සඳතියි උනුමු, (ඇදුර, තොප වෙන) ගායනා කරතියි (අපි) නොදන්නෙමු.

මෙහි අප තුටු නොවෙති (ය්) , අප සිප් නොදැනිති (ය්) තොප වෙන සඳති (ය්) , තොප ගායනා කරති (ය්) යන අතුරු වැකකි හතරේ අවසාන ක්‍රියා හතර, ප්‍රතම පුරුශ බහු වචනයෙන් තබා ඇත්තේ 'සංශයාර්තය (සැක කටයුතු අදහස) එල කරන අතුරු වැකියේ කර්තෘ අනුක්ත රූපය ගැනීමත්, ආකෘතය ප්‍රථම පුරුසා බහු වචන රූපය ගැනිමත් සියබ-සේ ඉතා වැදගත් විරයන රිතියක් නිසාය. ඒ රිතිය අතීත කාලයට මෙන්ම අනතීත කාලයටද පොදුය. 'එන කල දෙදහස් පන්සිය රජතු එතිස් දියනා' යන තැනත් 'ඔවින් අද පැමිනෙතියි කියති ' යන තැනත් ඇත්තේ අනතීත කාලයත්, ඒ දෝසය තේරුම් ගැනීම සඳහා මේ නිදසුන් කීපය ප්‍රමාණවත් වෙතියි සිතමි.

උපසර්ගයක් නාමයක හෝ ක්‍රියාවක මුලට එකතු කිරීම සිය බසේ සිරිතයි. එය තනි පදයකි. අනු, බල, අනුබල , පිරි සුදු පිරිසිදු , පිලිදුතුරු,පිලිතුරු , පිරිමඳ, පිරිමඳ (පිලිගනී) පිරි වර පිරිවර (පිරිවරයි) පිලි ගන් පිලිගන් (පිලිගනි) , පිලි පද පිලිපද (පිලිපදී) ආදී වශයෙන් සකස් වූ පදයක් මැදට නිපාත පදයක් රංගවිය නොහැකිය. (හැකි අ හැක්ක හැක වන නිසා ' හැකිය' ත් 'හැක' ත් යන දෙවරුවම නිවරදය)

එනිසා පිරි නො මදී පිරිනොමදී, පිරි නො වරා පිරිනොවරා, පිලිනොපදී පිලිනොපදී, පිලි නො ගනී, පිලිනොගනී යනු නිදෙස් වහර නොවේ. පද වෙන් කිරීමේ සම්මත නියරට අනුව එය පද දෙකකි. 'නො' නිපාත පදය ' පිලිගනී. ක්‍රියා පදයට එකතු කොට ලිවීම නිවැරදි නොවේ. එහෙත් අද ඒ නියරට ගරු නොකරනු පෙනේ. යනුවෙන් තනි පදයක් හද ගත හැකිය. එහෙත් නො නිද්‍රා නිනිඳ , නො කා නිකා යනු නිදෙස් ලෙෂ නොගැනේ.

පාලිතයන්ගේ ලිපියෙහි එන 'මිනිසුන් එදිනෙද වහ රන ජීව භාෂාවක් වන සිංහලයේ වෙනස් නොවන වියරන රිති තිබිය නොහැකිය..... එවැනි බසක් වෙනස් නොවන වියරන වැටකින් බැඳ තබන්නේ කෙසේද ? " යන වැකකි තුනිනි දෙන පනිවිඩය බසේ දියුනුව කැමති උගතු න් ගේ ඇසි ඇරවීමට හේතු වෙතැයි සිතමි. එය කාලෝචිත අදහසකි.

අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොවැ නොනඟී.
සිඟා කෑම බරි උනු තැන ලගී ගයා
මර ගී

යනුවෙන් කුමාරතුංග පඬිතුමන් කියන දේ මෙහිදී සිහිවේ.

එහි මුල් පද හතර -අලුත් අලුත් මග නොතනන / නොසෙයෙන' යනුවෙන් හෝ 'හන මිටි බිම තැබුව නොරිසි' යනුවෙන් වෙනස් වීම මැනෑයි සිතමි.

'ආලෝක' ශබ්දය සිංහලට බිඳෙන්නේ 'අලු' යනුවෙනි. (ආලෝකයාමය) අලුය, (ඒකාලෝක) එකලු' ය න දෙතනත්, සඳලුතල, සැදැල්ල යන තැනත් එයට නිදසුන් ලෙෂ ගත හැකිය.

අනම්‍යාදේශය අනුව 'අලු' ම 'ඇලි' වේ. ඒ 'ඇලි'

වි ක ධර්මබන්ධු

පසුව 'එලි' වේ. මහන-මැහැති. මෙහෙනි, මනවු-මැනැවි, මෙනෙවි , නළු -නැළි, නිළි යන පද හැඳෙන්නේත් ඒ නියරට අනුවය.

එහෙත් පුදුමය වන්නේ 'අලු ' ම 'ඇලි' වී ඇතත් 'ඇලි' ම 'එලි' වීමේදී දන්තජ 'ල' යන්න මුර්ධජ 'ළ' වීමය.

න/ණ, ල/ළ පන මෙන් රකිනා උගතුනුත් 'එළිය' යෑම ගැනත් ලියනු දකින විට සාරය්යාගේ ' අනේ අනිච්චං' සිහි වේ.

පාලිතයන් කියනනේ ඇත්ත කතාවකි. එදා 'හේ හඬය්'

අද 'ඔහු හඬය්' වී ඇත. එදා 'ඔහු හඬති' අද 'ඔවිහු හඬති' වී ඇත. එදා 'ඕ' හැඬුහ' අද 'ඈ හැඬුවාය. වී ඇත. තවත් නිදසුන් මී ලඟ ලිපියෙන් එලි දැක්වීමට අදහස් කරමි.

ඉංග්‍රිසියේ Bra/S, Crock/s, Chimp/s වැනි වචනත් No thru road, 4 sale යන, කඩවකිත් (202) (Two o two) වූ ඕ වූ යන වියහරත් එබඳු තැන් විය හැකිය.

ඇමරිංගිරිසයේ Meter (Metre) Center (Centre) Labor (Labour) Harbor (Habour) Check (Cheque) වැනි වචන තවමත් ඇමරිකාවෙට සීමා වී ඇද්දැය් නොදනිමි. ඕස්ට්‍රේලියිවේ 'Labor' පක්සය නම් එය අනුගොස් ඇත.

පෙබරවාරි සන්නයේ ටුල් පිටුවේ 'Burwood Besen Center' යනුවෙන් 'Center' ලියා ඇත්තේ වැරදීමකින් දැයි නොදනිමි.

Centre- Central වෙතත් Minister-Minsitral නොවී Ministerial වන්නේ එක්තරා රිතියක් අනුව යය් සිතමි. ඒ අනුව නම් Center - Central විය යුතු යය් සිතමි.

ඉතිරිය මීලඟ ලිපියෙන්.

වි ක ධර්මබන්ධු මහතා ලියන සුභාශිතය ලිපිය ළඟන කළාපයේ සිට නැවත ඇරඹෙයි